# මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනවල **තනතුරෙහි ස්ථිර කරන ලද සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් 2021/11/30 **වෙනි දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.**

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි එය සලකා බලනු නොලැබේ.

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව වෘත්තීය/යෝග්‍යතා/ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

## 01. තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය තනතුර

අවශ්‍ය සුදුසුකම් :

(I) ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) හෝ ඒ සමාන සුදුසුකම් ලබා තිබීම ;

හෝ

(II) ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම,

හෝ

(III) අදල විෂය ක්ෂේත්‍රය පිළිබඳ වන උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

(IV) අදාළ විෂය ක්ෂේත්‍රයට අදාලව වසර දෙකක පූර්ණ කාලීන ඩිප්ලෝමාව සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම,

**ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය, තොරතුරු තාක්ෂණය, පරිගණක දෘඩාංග හා ජාලකරණය, රේෂකර්ම හා ඇඟළුම් තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි සුදුසුකම් සපුරාලන අය කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ලැබේ.**

වැටුප් ක්‍රමය - U-MT1(II) රු. 35,145-7x355;9x495-42,085/-(මාසික)

(මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම – ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි**

## 02. කළමනාකරණ සහකාර (ගබඩා පාලන) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** (1) අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සදහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් එකවර සමත් වී තිබීම.

(i) සිංහල භාෂාව/ දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
(iii) ගණිතය

සහ

(2) අ.පො.ස (උ.පෙළ) විභාගයේ සියළු විෂයයන් එකවර සමත් වීම (පොදු පරීක්ෂණය හැර)

පහතින් දක්වා ඇති සුදුසුකම්ලත් අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳව වසර 02 ක පළපුරුද්ද

**<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>**

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

ගබඩා පාලනය පිළිබඳ වසර 01 ක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී වාණිජ්‍ය විෂයය සමත්ව තිබීම හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයේදි ගණකාධිකරණ විෂයය සමත්ව තිබීම.

**සටහන-** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතන විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් /ඇප මුදලක් ඉදිරිපත් කළ යුතුය.

වැටුප් ක්‍රමය : U-MN I(III) රු.30,725-17x300-35,825 (මාසික)

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය – ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.**

## 03. කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** (1) අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සදහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් එකවර සමත් වී තිබීම.

(i) සිංහල භාෂාව/ දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
(iii) ගණිතය

සහ

(2) අ.පො.ස (උ.පෙළ) විභාගයේ සියළු විෂයයන් එකවර සමත් වීම (පොදු පරීක්ෂණය හැර)

පහතින් දක්වා ඇති සුදුසුකම්ලත් අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳව වසර 02 ක පළපුරුද්ද

__තනතුරට විශේෂ වූ සුදුසුකම්__

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (සරප්) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

අ.පො.ස (උ.පෙළ) විභාගයේ සමත් විෂයයන් තුන අතරින් එක් විෂයයක් ගණකාධිකරණය විෂයය විය යුතුය.

**සටහන -** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතන විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් /ඇප මුදලක් ඉදිරිපත් කළ යුතුය.

වැටුප් ක්‍රමය : U-MN I(III) රු.30,725-17x300-35,825 (මාසික)

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය – ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.**

## 04. __පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය__

අවශ්‍ය සුදුසුකම්: (1) එකවර පහත සඳහන් විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

(i.) සිංහල භාෂාව/ දෙමළ භාෂාව
(ii.) ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
(iii.) ගණිතය

සහ

(2) උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයේ ප්‍රාථමික මට්ටමේ එනම් U-PL වැටුප් කේතයට අයත් දැනට දරණ තනතුරෙහි ස්ථිර සහ තහවුරු කරන ලද අවම වශයෙන් වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

__සටහන__

පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

වැටුප් ක්‍රමය : රු.30,725-17x300-35,825/-(මාසික) U-MN 1(III)

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය – ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි**

05. <u>**මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)**</u>

අවශ්‍ය සුදුසුකම්: (i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත් විශ්වවිද්‍යාල සේවයේ ස්ථිර සේවකයෙකු වීම.

වැටුප් ක්‍රමය : රු.31,625-7x300;10x355-37275/-(මාසික) U-MT 1(III) A

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය – සම්මුඛ පරීක්ෂණයක් මගිනි**

06. <u>**ඖෂධවේදි (පහළ ශ්‍රේණිය)**</u>

අවශ්‍ය සුදුසුකම්: (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් ඖෂධවේදි වශයෙන් සුදුසුකම්ලත් සහතිකයක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.31,625-7x300;10x355-37275/-(මාසික) U-MT 1(III) A

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය – සම්මුඛ පරීක්ෂණයක් මගිනි**

ලේඛකාධිකාරි
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව

2021.11.08